- **<u>ඔබේ පෙළපොතෙහි පිටු අංක 80, 81 හි ඇති කෙඳි වර්ග කීපයක් නිරීක්ෂණය කිරීමෙන් ලබා ගත් නිගමන දැක්වෙන වගුව හොඳින් අධ්‍යයනය කරන්න.</u>**
- **<u>පහත ක්‍රියාකාරමෙහි නිරතවන්න.</u>**

පියවර 01 - ඔබේ නිවසේ ඇති විවිධ රෙදි වර්ග වල කැබලි 5ක් සපයා ගන්න.

පියවර 02 - එම රෙදි කැබලි වල කෙඳි කීපයක් වෙන් කර ගන්න.

පියවර 03 - එම කෙඳි යොදා ගනිමින් පහත අවස්ථාවන්ට අදාළව නිරීක්ෂණයන් සිදු කර සටහන් කර ගන්න.

1. ස්පර්ශ කිරීමේදී
2. කෙඳි කඩා බැලීමේදී ඇතිවන ලක්ෂණ
3. කෙඳි කීපයක් ගිණි දළුවකට අල්ලා පිළිස්සීමේදී ලැබෙන නිරීක්ෂණ (මෙහිදී ක්‍රමෝපායන් අනුගමනය කරන්න.)

පියවර 04 - ඔබ සටහන් කරගත් නිරීක්ෂණ දත්තයන් හා පෙළපොත හි ලබා දී ඇති ලක්ෂණ හොඳින් සසඳන්න.

පියවර 05 - ඒ අනුව ඔබ සතු රෙදි කැබලි සකසා ඇති කෙඳි වර්ගය කුමක්දැයි හඳුනාගැනීම සිදු කරන්න.